# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1929/5 - 2015 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2015.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය :- 11/3/3/1/12.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :- LD/05/2008/MV/300.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර**

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ, E 397 බී මිණිරන්කැටිය වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2012.09.28 දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13 හි, අතුරු පිඹුරු අංක 235 හි, පත්‍ර අංක 191 දරන සැළැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.2373 ක් වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබලි අංකය 5301**
ඉඩමේ නමː මිණිරන්කැටිය; විස්තරයː ළඳු කැළෑව; හිමිකම් කියන අයː රජය; ; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.1624.

02. **කැබලි අංකය 5321 $^{2}/_{2}$**
ඉඩමේ නමː මිණිරන්කැටිය; විස්තරයː විවෘත මුඩුබිම; හිමිකම් කියන අයː රජය; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0749.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015.09.23 වැනි දින, පූ:භා 9.00ට, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2015. 09.18 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

නිරෝෂණ කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල-පල්ලේගම කොට්ඨාසය.

2015 අගෝස්තු මස 17 වැනි දින,
ලග්ගල-පල්ලේගම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

09-143/1

---

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය :- 11/3/3/1/12.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :- LD/05/2008/MV/300.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ, E 397 බී මිණිරන්කැටිය වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2012.09.28 දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13 හි, අතිරේක අංක 67 හි, පත්‍ර අංක 192 දරන සැළැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.4420 ක් වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබළි අංකය 5373**
ඉඩමේ නමː - ; විස්තරයː මාර්ගය; හිමිකම් කියන අයː රජය; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0136.

02. **කැබළි අංකය 5374**
ඉඩමේ නමː - ; විස්තරයː ප්‍රාදේශීය සභා මාර්ගය; හිමිකම් කියන අයː රජය; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0093.

03. **කැබළි අංකය 5375**
ඉඩමේ නමː පෙරවත්ත බෝම්බුව හෙවත් මිණිරන්කැටියේ මූකලාන; විස්තරයː ගල සහ ළඳු කැළෑව; හිමිකම් කියන අයː රජය ; ඉඩම් ප්‍රමාණයː හෙක් 0.2298.

04. **කැබළි අංකය 5376**
ඉඩමේ නමː - ; විස්තරයː හල්මිණි ඔය; හිමිකම් කියන අයː රජය ; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.1638.

05. **කැබළි අංකය 5405**
ඉඩමේ නමː - ; විස්තරයː වාරි ඇළ; හිමිකම් කියන අයː පෞද්ගලික; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0014.

06. **කැබළි අංකය 5408**
ඉඩමේ නමː -; විස්තරයː මාර්ගය; හිමිකම් කියන අයː රජය; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0033.

07. **කැබළි අංකය 5418**
ඉඩමේ නමː -; විස්තරයː මාර්ගය; හිමිකම් කියන අයː රජය ; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0095.

08. **කැබළි අංකය 5427**
ඉඩමේ නමː -; විස්තරයː වාරි ඇළ; හිමිකම් කියන අයː රජය; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0073.

09. **කැබළි අංකය 5430**
ඉඩමේ නමː -; විස්තරයː වාරි ඇළ; හිමිකම් කියන අයː රජය ; ඉඩම් ප්‍රමාණයː හෙක්. 0.0040.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015.09.23. වැනි දින, පූ. භා. 9.00ට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි

තව ද, 2015. 09.18 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල-පල්ලේගම කොට්ඨාසය.

2015, අගෝස්තු මස 17 වැනි දින,
ලග්ගල-පල්ලෙගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය

09-143/2

සංශෝධනයයි

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

මගේ අංකය ː- බිය **3/1/1/237.**

වර්ෂ 2015 ජනවාරි මස 26 වැනි දින අංක 1899/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සඳහන් මූ.පි. ගම්. 3437 දරන පිඹුරේ කැබලි අංක 72 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

01. **කැබලි අංක 72**
ඉඩමේ නම : වරිපනම් අංක 893, නුවර පාර; විස්තරයː ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : කේ. එම්. කටුලන්ද, අංක 145/ඒ, නුවර පාර, කඩවත; ප්‍රමාණය : හෙක්. 0.0015

ඩබ්. එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්
බියගම.

2015 අගෝස්තු මස 12 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-20

---

ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය ː- KDS/KGK/4/2(1)/2013/11/LA.

උක්ත ශීර්ෂ යටතේ අංක 1923/68 හා 2015 ජූලි මස 17 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් පහත සඳහන් සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු කොටස* | *ඉවත් කළ කොටස වෙනුවට ආදේශ කළයුතු කොටස* |
|---|---|
| 2015 ජූලි 30 | 2015 අගෝස්තු 27 |
| 2015 ජූලි 20 | 2015 අගෝස්තු 20 |

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවටකොරළේ.

2015 අගෝස්තු මස 14 වැනි දින,
මහනුවර කඩවත් සතර හා ගඟවටකොරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-21

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.